# ණය අයකර ගැනීමේ
# බාහිර නියෝජිත ආයතන සඳහා
# චර්යාධර්ම පද්ධතිය

# චර්යාධර්ම පද්ධතිය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්ති මඟපෙන්වුම් සමඟ මෙහි සඳහන් නීතිරීති මත පදනම්ව කෙටුම්පත් කරන ලද මෙම චර්යාධර්ම පද්ධතිය, සේවා සැපයුම්කරුගේ සියලු සේවකයින්/එකතු කරන්නන් සඳහා අදාළවන අතර, ඔවුන් විෂය වනු ඇති යම් අතිරේක නීතිරීති වේ නම් ඒවාද පිළිපදිනු ඇත.

## පටුන

- හැඳින්වීම - බැංකුව/නියෝජිත ආයතනය
- නියෝජිතයෙකුගේ චර්යාව හා විනීත භාවය
- රහස්‍ය භාවය පිළිබඳ දිවුරුම

## හැඳින්වීම - බැංකුව හා නියෝජිත ආයතනය

***බැංකුව***

මෙහි *''බැංකුව''*යනුවෙන් හැඳින්වෙන හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් විසින් සිය අභිමතය පරිදි සිය ගිණුම් පොත්වල නොගෙවූ ණයවලින් පැනනගින, හිඟව ඇති ගෙවීම් අයකරගැනීමට සහයවීම සඳහා ණය අයකරගැනීමේ බාහිර නියෝජිත ආයතනයක සේවාවන් ලබාගනු ඇත.

***සේවා සැපයුම්කරු***

ශ්‍රී ලංකාවේ සමාගම් පනත යටතේ නිසි ලෙස ලියාපදිංචි කළ සහ එය විසින් ලබාදෙන සේවාව සම්බන්ධයෙන් බැංකුව විසින් අනුමත කළ ණය අයකරගැනීමේ බාහිර නියෝජිත ආයතනයක් විසින් බාහිර ණය අයකරගැනීමේ ක්‍රියාකාරකම් සිදුකරනු ඇත.

## ණය අයකරගැනීමේ නියෝජිතයෙකුගේ චර්යාව හා විනීතභාවය

ණය එකතුකිරීමේ නියෝජිත ආයතනය නියෝජනය කරන්නෙකු ලෙස මෙසේ පත්කරනු ලබන නියෝජිතයා විසින් බාහිර ණය අයකරගැනීමේ ක්‍රියාදාමයට අදාළ වන විශේෂිත කාර්යයන් ඉටුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- ඔහුගේ/ඇයගේ චර්යාවෙහි දී ඉහළ මට්ටමක අවංක භාවය, නිර්ව්‍යාජ භාවය, සහ වෘත්තීය තත්ත්වය විදහා දැක්වීම.

- ගනුදෙනුකරුට/ කිසිදු සම්බන්ධිත පාර්ශ්වයකට අපහසුතාවයක්/ හිරිහැරයක් වන ආකාරයට කිසිදු තත්ත්වයක් යටතේ කටයුතු නොකිරීම/නොහැසිරීම.

- මුදල් එකතු කරන්නෙකු ලෙස පමණක් නොව, ගනුදෙනුකරුගේ මූල්‍ය උපදේශකයෙකු ලෙස ද ඔබ සතු කාර්යභාරය වටහා ගැනීම.
- සන්නිවේදනය කෙරෙන දෑ ඔබ විසින් පැහැදිළිව වටහා ගනු පිණිස මෙන්ම සියලුම අවස්ථාවන්හි දී පීඩාකාරී වචන භාවිත කිරීමෙන් වැළකීම පිණිස, භාවිත කරනු ලබන භාෂාව නිසි අයුරින් භාවිත කිරීම.
- අයකරගැනීමේ විෂයය සම්බන්ධයෙන් පුළුල් මෙන්ම යාවත්කාලීන වූ දැනීමකින් යුක්ත වීම.
- සාර්ථක ලෙස කේවල් කිරීමේ හැකියාව හා දක්ෂතාව සහ ඒත්තු ගැන්වීමේ හැකියාව තිබීම.
- තෙවන පාර්ශ්වයන් වෙතින් තොරතුරු ලබාගැනීමේ දී ගනුදෙනුකරුගේ තොරතුරුවල රහස්‍ය භාවය හා සංවේදී භාවය ආරක්ෂා කිරීම. ගනුදෙනුකරුගේ නොහික්මුණු හැසිරීමකට සහ විරෝධයකට ලක්වන අවස්ථාවක දී පවා සංයමයෙන් හැසිරීම.
- අයකරගැනීමේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් සවිඥාණිකව සිටිය යුතු අතර, ණය අයකරගැනීමේ හෝ තොරතුරු ලබාගැනීමේ ක්‍රියාදාමයේ දී කිසිදු ආකාරයකින් වාචිකව හෝ ශාරීරිකව පීඩාවක් නොකිරීම.
- මුදල් එකතුකිරීමේ සෑම ගමනක දී ම වෘත්තීයමය ඇඳුමින් සැරසී සිටීම. එකී ඇඳුමට පහත දෑ ඇතුළත් විය යුතුය.
  - නිල සේවක හැඳුනුම්පත පැහැදිළිව ප්‍රදර්ශනය විය යුතුය.
  - නියෝජිතයා අවසර ලත් මුදල් එකතුකිරීමේ නියෝජිත ආයතනයක නියෝජිතයෙකු වන බවට හඳුන්වා දෙන නම්පතක්.
  - කිසිදු අවස්ථාවක දී නියෝජිතයා විසින් තමන් HSBC හෝ එහි සමූහ කාර්යාලවල කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ලෙස හඳුන්වා නොදිය යුතුය.

- කිසිදු කොමිස් මුදලක්, මුදල්මය ත්‍යාගයක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ගනුදෙනුකරු හෝ වෙනත් යම් අයෙකු වෙතින් හෝ භාර නොගත යුතුය.
- නියෝජිතයා විසින් නීතිය අනුකූලව කටයුතු කළ යුතු අතර, බැංකුවේ ව්‍යාපාරයට, අවංකභාවයට, කීර්ති නාමයට හෝ හොඳහිත ට අගතියක් සිදුවන ක්‍රියාවන්ගෙන් වැළකිය යුතු ය. සිය රාජකාරිය ඉටුකිරීමේ ක්‍රියාදාමයේ දී පිළිපැදිය යුතු වන පහත දැක්වෙන අවම අවශ්‍යතාවයන්ට අනුකූලව නියෝජිතයන් විසින් තරයේ ක්‍රියාකළ යුතුය.
  - මුදල් අයකරගැනීමේ කටයුතුවල දී කිසිදු තැනැත්තෙකුට එරෙහිව බියගැන්වීම හෝ (ශාරීරික/වාචික) හිංසනය භාවිත නොකළ යුතු ය.

- බැංකුව විසින් ගිණුම් පැවරුම අවස්ථාවේ දී සඳහන් කරනු ලබන (තීරක/තෙවන පාර්ශ්වය ලෙසින් ද හැඳින්වෙන) 'ළඟම ඥාතියා' ට අදාළ වන තොරතුරු භාවිත කළ යුත්තේ, ප්‍රාථමික ණයකරු සොයාගැනීමට සහයක් ලබාගැනීමේ මෙවලමක් ලෙස පමණකි. එවැනි පාර්ශ්වයන් කිසිදු ආකාරයකින් ණය සම්බන්ධයෙන් වගකිව යුතු නොවන අතර, ඔවුන් වෙතින් කිසිදු මුදලක් ඉල්ලා සිටිය නොහැක.
- හිඟ ශේෂය /ගිණුම් අංක වැනි රහස්‍ය තොරතුරු, මෙම පාර්ශ්වයන් වෙත කිසිදු හේතුවක් මත හෝ හෙළිදරව් නොකළ යුතු ය.
- නුසුදුසු වේලාවන්හි දී දුරකථන ඇමතුම් ලබාදීම, බලපෑම් කරමින් ණයකරුවන්ට දුරකථන ඇමතුම් ලබාදීම මඟින් හිරිහැර කිරීම, ණයකරු සොයාගැනීමට පවුලේ සාමාජිකයින්ට, (තීරක/තෙවන පාර්ශ්වය යනුවෙන් ද හැඳින්වෙන) ළඟම ඥාතීන්ට, හිතවතුන්ට හිරිහැර කිරීම, නිර්නාමික දුරකථන ඇමතුම් ලබාදීම, ගෙවීම් කිරීමට ණයකරු පෙළඹවීමේ අරමුණ ඇතිව ව්‍යාජ හෝ නොමඟ යැවෙන අනන්‍යතාවලින් පෙනී සිටීම වැනි හිංසාකාරී ක්‍රියා/ අයෝග්‍ය උපක්‍රම යොදා නොගත යුතුය.

## රහස්‍ය භාවය පිළිබඳ දිවුරුම

ණය අයකර ගැනීමේ ක්‍රියාදාමයේ දී එම රාජකාරිය ඉටුකිරීමට යොදවන ලද නියෝජිතයින්ගේ උපරිම චර්යාවට හා දැනීමට අනුව, සංවේදී යැයි සැලකෙන යම් තොරතුරක් ආරක්ෂා කිරීමට ණය අයකරගැනීමේ නියෝජිත ආයතනය බැඳී, කැපවී සිටියි.

ඉහත කරුණුවල සමස්තයට අනුව, ණය අයකරගැනීමේ නියෝජිතයෙකු එම ක්‍රියාදාමයට අදාළව පහත දැක්වෙන කරුණුවලින් බැඳී සිටිනු ඇත.

- කිසිදු ආකාරයකින් ගනුදෙනුකරුවෙකුගේ කිසිදු කරුණකට අදාළ තොරතුරක් සාකච්ඡා කිරීම, ප්‍රසිද්ධ කිරීම, මුද්‍රණය කිරීම හෝ පළකිරීමෙන් වැළකීම.

චර්යාධර්මවලට අදාළ ව අනුගමනය කළ යුතු වන මෙම ලේඛනයේ අන්තර්ගත නොවන යම් තොරතුරක් හා යම් අනුකූලතාවයක් ණය අයකරගැනීමේ බාහිර නියෝජිත ආයතනය හා බැංකුව විසින් අත්සන් කර තහවුරු කළ මුල් ගිවිසුම හා සමගාමීව අදාළ කරගත යුතුය.